චරිතාපදානය

අපේ

# අගමැති

අග්‍රාමාත්‍ය

විජයානන්ද දහනායක මහතා

සංස්කරණය: රෝහණ පී. ගමගේ

ප්‍රකාශනය: චන්ද්‍රා අබේවර්ධන

# හැඳින්වීම

අග්‍රාමාත්‍ය විජයානන්ද දහනායක මහතා අධ්‍යාපන ඇමති වුවාට පසු හා පෙර එතුමා මේ රටට කළ සේවයෙන් ඉතාම සුළු විස්තරයක් මේ පොත් පිංචට ඇතුළත් වී ඇත. මා දන්නා තරමට, මට සපයා ගන්නට ලැබුණු විස්තර අනුව පැය කිපයකින් සකස් කළ මේ පොතේ අඩුපාඩුකම් වෙතොත් කමාවන මෙන් පාඨකයින්ගෙන් ඉල්ලා සිටිමි.

**රෝහණ ජී. ගමගේ**

13. 3. 60.

කොළඹදිය.

# අපේ අගමැති

මීට අවුරුදු 33 කට පෙර භාරත පියාණන් වූ මහත්මා ගාන්ධිතුමා ගාල්ලට පැමිණි අවස්ථාවේදී සිහින් සිරුරකින් යුත් තරුණයෙක් මහාජනයා පිරි සභා වේදිකාවට පැමිණ ඉංග්‍රීසි කාව්‍යයකින් ගාන්ධිතුමා පිළිගත්තේය.

මේ තරුණයාගේ ඒ කාව්‍යය හේතුකොටගෙන තදින්ම සිත ඇදී ගිය ගාන්ධිතුමා, “ලංකාව වැනි රටකට මෙවැනි එඩිතර අදහස් ඇති වීර තරුණයන් සිටීම මහත් ආඩම්බරයකැ” යි ද ලංකාවේ නායකයෙක් වීමට මේ තරුණයාට හැකියාව පිහිටා තිබෙන්නේ යයි අනාවැකියක් ද පළ කළේය.

මහත්මා ගාන්ධිතුමා එදා ඒ අනාවැකිය පළකළ තරුණයා අන් නිසිවකු නොව පොදු ජනතාව අතර, පොදු ජනතාව වෙනුවෙන් ඉපිද, තමාගේ පෞද්ගලික සැප පහසුවක් හෝ පළ ප්‍රයෝජනයක් හෝ නොතකා අවංක සිතින්, එඩිතර කමින් සිය මුළු ජීවිතයම රට-ජාතිය-ආගම වෙනුවෙන් කැපකර අද ශ්‍රී ලංකාවේ අගමැති පුටුවේ වැඩවෙත ගාල්ලේ විජයානන්ද දහනායක මහතාය.

කලක් ගුරු වෘත්තියේ යෙදී සිටි මෙතුමා ගුරු වෘත්තියට සදහටම ආයුබෝවන් කියා දුක් විඳින ජනතාව වෙනුවෙන් සටන් කිරීම සඳහා තම ජීවිතය දේශපාලන භූමියට කැප කළේය.

හේ 1935 ගාලු නගර සභාවේ සභිකයෙක් විය. 1939 සිට 1942 වනතුරු ගාලු නගරයේ ප්‍රථම නගරාධිපතිවරයා වශයෙන් පත්විය. දිනකට පැය 10 ක් නගරාධිපති පුටුවේ වාඩිවී වැඩ කළේය.


හේ වැඩ කළේය, දිගටම වැඩ කළේය. දිවා රෑ නොබලා වැඩ කළේය. සත භාගයක ආදායමක් තමන්ට ලැබුණද කියා නොලබා දුකී ජීවිතයක රස බලමින් ඒ කළ සේවය දුප්පතා වෙනුවෙනි.

1943 දී බිබිලේ මන්ත්‍රීවරයා වශයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට පත්වූ දහනායක මහතා එදා අයවැය විවාදයේදී නොකඩවා පැය 14½ ක් සිය චතුර කථිකත්වය පිළිබිඹු කරමින්, සර් පොන්නම්බලම් රාමනාදන් මහතා 1915 දී ඇතිකළ ශතිය වාර්තාව බිඳ හෙළමින් ලංකා මැති සභයේ අලුත් වාර්තාවක් පිහිටුවේය.

1947 දී ප්‍රථම පාර්ලිමේන්තුව සඳහා වූ මහා මැතිවරණයේදී හේ ගාලු ආසනයට තරග කළේය. අවුරුදු කිපයක්ම රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ගාලු ආසනය හිමිකරගෙන සිටි මහා ධනවතෙකු වූ හෙන්රි අමරසූරිය මහතා පරාජය කරමින් ප්‍රථම වරට මහජන මන්ත්‍රී සභාවේ ගාලු මන්ත්‍රී පදවිය දිනුවේය.

## යූ. ඇන්. පී. යුගය

1956 ට පෙර යූ. ඇන්. පී. රාජ්‍ය පාලන යුගය පොදු ජනතාවගේ ඉතා අවාසනාවන්ත අඳුරු කාලය හැටියට ප්‍රකට විය. එදා ජනතාව දහසකුත් එකක් අතවර මධ්‍යයේ විශ්වාස කටයුතු යහපත් ජනනායකයකුගේ පිහිට සොයමින් සිටි අවස්ථාවක සිටි පාලකයින්ගේ දූෂණ ක්‍රියාවලට බලවත් විරෝධය දැක්වීමට විය. අසරණ ජනතාවගේ එවැනි ඉල්ලීමකට වත් සමත් නොදුන් යූ.ඇන්.පී. රාජ්‍ය සත 25 ට තුබූ බෝල සලාකයේ මිල සත 70 දක්වා ඉහළ නංවා, පොදු ජනතාව පිට උසුලන්නට බැරි ජීවන බරක් පැටවීය. සත 05 ට තිබූ තැපැල් මුද්දරයේ මිල සත 10 දක්වා වැඩි කළේය. දුප්පත් පාසල් ළමුන්ට දුන් බත් බනිස ගෙඩිය උදුරා ගත්තේය. දුප්පත් ජනතාවගේ එදිනෙදා ජීවිතයට අවශ්‍ය බඩුමිල කිසිම අනුකම්පාවකුත් නොතකා ඉහළ දැම්මේය. උසුලන්නට බැරි ජීවන බරක් කර පිටට ගත් මහාජනයා යූ. ඇන්. පී. රාජ්‍යේ මේ අසාධාරණ ක්‍රියාවලට විරුද්ධව සිය සාධාරණ කෝපය යූ.ඇන්.පී. රාජ්‍යට එල්ල කළ අවස්ථාවේ එවකට අගමැතිව සිටි ඩඩ්ලි සේනානායක මහතාගේ යූ. ඇන්. පී. ආණ්ඩුවේ නියමය පිට සාධාරණ මහජන කෝපය මැඩ පැවැත්වීම සඳහා වෙඩිතැබීමෙන් අසරණ ජීවිත කිහිපයක් මරුමුවට පත්කළේය. එතෙකින්ද නොනැවතුණු එකී ආණ්ඩුව



පොදු ජනයා වෙනුවෙන් දිවා, රාත්‍රී නොබලා සේවයක් කළ දහනායක මහතා ආගමික වතාවත්වලට ද ලැදි විය. අස්ගිරි මහානායක හිමියන්ට අටපිරිකර පූජා කරන අවස්ථාවකි.



විජයානන්ද දහනායක මහතා අධ්‍යාපන ඇමති වූ ද, සිටම විය. අධ්‍යාපනයේ දියුණුව තකා ඉමහත් සේවයක් කළේ ය. විද්‍යාගාරයක විද්‍යා ප්‍රදර්ශනයකදී ශිෂ්‍යයින් අතින් කළ විද්‍යා හපන්කමක් දහනායක මහතා පරීක්ෂා කරනු මෙහි දැක්වේ.

අභිරාජ්‍යවාදීන්ගේ බලය ආරක්ෂා කරමින් ධන බලය, නීල බලය යන මේවායින් ද පොදු ජනතාව පීඩාවට පත්කරන ලදී. දිනෙන් දින, සතියෙන් සතිය, මසින් මස රට, ජාතිය, ආගම විපතටම ගොදුරු කරමින් යූ. ඇන්. පී. පාලකයෝ මහාජනතාවගේ කඳුළුවලින් තෙත් වූ බිමක සිටගෙන ජය පානය කළහ.

## ආණ්ඩු පෙරළිය

මේ කාලයේ පොදු ජනතාවගේ පැත්ත ගෙන පොදු ජන විමුක්තිය තකා වැඩ කිරීමට, දිවංගත ගරු ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා සමග අත්වැල් බැඳගත් විජයානන්ද දහනායක මහතා යූ. ඇන්. පී. යේ දූෂණ ක්‍රියාවලින් ගඳ ගසන ලංකාව පවිත්‍ර කර පොදු ජනතාවට නව යුගයක් උදා කිරීම සඳහා සටන් බිමේ වැදගත් පියවරක් ඉදිරියට තැබීය. මේ වකවානුවේදී අද නායකයින් යයි කියා ගන්නා සමහරු හා අගමැති බුරයට පොරකන ඇතැම් අය තම පුරුදු දේශපාලන පොත පෙරලමින් වැටවල් උඩට වී බලා සිටියදී, දහනායක මහතා ගරු බණ්ඩාරනායක මැතිතුමාත් සමග ඒ විමුක්ති සටන මෙහෙය වූයේය.

ගාල්ලෙන් පටන් ගත් සටන හේ මෙහෙය වූයේ පොත බලමින් පොතේ හැටියට නොවේ. තම රටට ඔබින, තම ජාතියට ගැළපෙන, තම ආගමට උවන පිළිවෙත් බල බලා, හේ සටන් කළේය, දිගටම සටන් කළේය, නොතැවති සටන් කළේය, ඒ සටන, කාලයට ඔබිනසේ මෙහෙය වූයේය. සාධාරණ මහාජන කෝපය කිසිම ලේ වැගිරීමක් නොමැතිව යූ. ඇන්. පියට එල්ල විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් යූ.ඇන්. පියට අන්ත පරාජයක් හිමිවිය. ගරු බණ්ඩාරනායක අගමැතිතුමාගේ නායකත්වයෙන් පිහිටුවන ලද මහජන රාජ්‍යේ මුඳුන් කැණුව වශයෙන් හැඳින්විය හැකි අධ්‍යාපන ඇමති බුරයට විජයානන්ද දහනායක මහතා පත්විය.

## කලා සේවය

උදාවූ නවයුගයේ—නව රාජ්‍යේ අධ්‍යාපන ඇමති වූ දහනායක මහතා, මැතිවරණයේදී මහාජනතාට දුන්

පොරොන්දු එකින් එක විසඳීමට පටන් ගත්තේය. අධ්‍යාපනයේ මහා විප්ලවයක් ඇති කළේය. ඒ විප්ලවය ලංකා ඉතිහාසයේ රන් අකුරෙන් ලියවුණේය. අපේ රටේ පාසල් නොයන දරුවන් පිළිබඳ ප්‍රශ්නය විමසා බැලීම සඳහා දහනායක මහතා ඇමතිවරයා වශයෙන් වැඩකරන සමයෙහි කාරක සභාවක් පත් කළේය. මේ කාරක සභාවට සමාජසේවා නිලධාරීන්ද, ප්‍රොබේෂන් සේවා නිලධාරීන්ද, ස්වදේශ කටයුතු නිලධාරීන්ද ඇතුළත් කරමින් එකී ප්‍රශ්න එකින් එක විසඳීමට මෙතුමා කටයුතු කළේය. ඇමතිතුමාගේ මේ සැම වැඩ පිළිවෙළ නිසා පාසල්වලට දිනපතා පැමිණීමේ සංඛ්‍යාව වැඩිවිය. 1957 දී සියලු පාඨශාලාවල ළමුන් එක් ලක්ෂ පනස් අත් දහසකින් වැඩිවීම මුළු ජනතාවගේ සතුටට හේතුවක් විය.

ප්‍රථමයෙන්ම ශිෂ්‍යයින්ගේ සංඛ්‍යාව මේ පමණ සීඝ්‍රයෙන් වැඩිකිරීමට එතුමා ගත් පියවර කුමක්ද? පළමු වූ ද ඉතා වැදගත් වූ ද කරුණ නම් එදා යූ.ඇස්.පී. රාජ්‍ය විසින් තහනම් කරන ලද පාසල් ආහාර නැවත ලබාදීමයි. ඒ දවල් ආහාරයවූ බනිස් ගෙඩිය, කිරිස් සමග දීමට නැවතත් විධි විධාන යෙදවුණේය. නොමිලේ දවල් ආහාරය දීම නිසා පාසල් ළමුන්ට මහත් වරප්‍රසාදයක් වනු පමණක් නොව ඉතා දුකී තත්ත්වයේ සිටින මවුපියන්ට සිය දූ දරුවන් පාසල් යැවීමට මහත් රුකුලක් විය. අද ඒ දරුවන් 1,70,000 කට වැඩි සංඛ්‍යාවක් දවල් ආහාරය ලබයි. මේ දහවල් ආහාරය නිසා අතිරේකව පාසල්වලට පැමිණෙන ළමුන්ගේ ගණන 75,000 කට වැඩි විය. මෙපමණක් ද නොව මේ රටේ මන්දපෝෂණයෙන් පෙළෙන ළමයින් මන්ද පෝෂණයෙන් ගලවා ගැනීමට මේ දහවල් ආහාරය ප්‍රයෝජනවත් විය.

පාසල් සිසුන්ගේ සංඛ්‍යාව වැඩි කිරීමට ඇමතිතුමා දෙවැනි පියවරක් ගත්තේය. එනම් යෝග්‍යතා පරීක්ෂණය අවලංගු කර දැමීමයි. අටවැනි පන්තියේදී පැවැත්වෙන යෝග්‍යතා පරීක්ෂණයෙන් අසමත්ව පාසලින් ඉවත්ව රටට නිකමුන් ශිෂ්‍යයෙක් යන සිසුන්ට එදා රක්ෂා පිළිවෙළක් නොතිබුණේ ය. මේ යෝග්‍යතා පරීක්ෂණ ක්‍රමය දුප්පත් දරුවන්ට ඇති ඉතාම දුෂ්කර ක්‍රමය බව පිළිගත් එතුමා එය තහනම් කළේය.



විද්‍යෝදය-විද්‍යාලංකාර මහ පිරිවෙන් දෙක සරසවි බවට පත්කරමින් ලංකා ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ වංශ කථාවේ ඉදිරි කොටස පිටු ගණනක් ලියවෙන දිනක විජයානන්ද දහනායක අධ්‍යාපන ඇමතිතුමාගේ අමරණීය නාමයට ලැබෙන්නේ ලොකු තැනකි. ඒ උතුම් උත්සවයේදී ජාතික අමාත්‍ය ඩබ්ලිව්. දහනායක මහතා කථා කරන අයුරු මෙහි දැක්වේ.

නගර බඳ උසස් පාසල්වල මෙන්ම ගම්බඳ සාමාන්‍ය පාසල්වල ඉගෙනුම ලබන සිසුන්ට සම තත්ත්වයේ අධ්‍යාපන ක්‍රමයක් ලබාදීමට දහනායක මහතා ගත් මහන්සිය සුළුපටු නොවේ. විශේෂයෙන් කොළඹ රාජකීය විද්‍යාලය, කුරුඳුවත්තේ පදිංචි ළමයින්ට පමණක් සීමාවී තිබුණ ද, මේතුමා අධ්‍යාපන ඇමති වූ දා සිට රාජකීය විද්‍යාලය උස් පහත් භේදයක් නොතකා සැම ශිෂ්‍යයෙකුටම දොර ඇරුණේය. කලා අධ්‍යාපනය කිසිම තැනක් නැතිව තුබූ අවධියක සංගීතමය නැටුම් ගුරුවරුන් සැම පාසලකටම පත්කර ජාතික සංගීතය හා කලාවේ ප්‍රගතියට රුකුල් දුන්නේය. ඇමතිතුමාගේ මේ උත්සාහය නිසා ගිය වර්ෂය තුළ සංගීතය හා නැටුම් ගුරුවරුන් 600 කට පත්වීම් ලබා දී ඇත. 1958 හා 1959 අවුරුදු තුළ ජාතික සංගීතයේ හා ජාතික නැටුමේ වැදගත් සන්ධිස්ථානයක් වන්නේය. ජාතික සංගීතයේ ජාතික නැටුමේ හැකියාවක් ඇති විශාල ගණනකට මුල් වතාවට රාජ්‍ය සේවයට ඇතුල් වීමට මෙයින් හැකිවිය. හැම මධ්‍ය විදුහලකටත් හැම දෙවුණු පාසලකටම සංගීත ගුරුවරුන් පත්කිරීමට මං සැලසීය.

ගම්බඳ ඇති වැදගත් පාසල්වල තත්ත්වය ඉතා දුර්වල අඳමින් තිබෙනු දුටු දහනායක මහතා ඒ පාසල්වලට නව පණක් දුන්නේය. එම පළාත්වල පිහිටි ජ්‍යෙෂ්ඨ පාසල්වල ඉහළම පන්තිය තෙක් විද්‍යාව ඉගෙනීමට හැකි එසේ මං සැලැස්විය යුතුයයි එතුමා නියම කළේය. විද්‍යා රසායනාගාර සඳහා එහි පන්ති කාමර පිළියෙළ කරන ලදුව එයට සැහෙන උපකරණ ද දෙන ලදී. පාසල් සිසුන් 1000 කට විද්‍යා ශිෂ්‍යත්ව පිරිනමන ලදී.

## විද්‍යා අධ්‍යාපනයට දුන් තැන


ගම්බඳ පාසල්වල සිසුන්ට විද්‍යාව පිළිබඳ අධ්‍යාපනයක් ලැබීමේ අවස්ථාවක් නොවූ අවස්ථාවේදී නගරබඳ උසස් පාසල්වලට මෙන්ම ගම්බඳ සාමාන්‍ය පාසල්වල ඉගෙනුම කරන සිසුන්ට විද්‍යාව ඉගැන්වීමේ වරප්‍රසාදය මෙතුමා විසින් ලබාදෙන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් විද්‍යාව උගත් තරුණ තරුණියන් දහසකට වැඩි ගණනකට අද රක්ෂා ලැබී තිබේ. විද්‍යාව කියනුයේ කුමක අන්දමේ

දැයක්ද?යි යනු කවදවත් නොදකපු—නොතැකරපු ගම්බඳ පාසල්වල ළමුන්ට අද විද්‍යාව පිළිබඳව පුළුල් අධ්‍යාපනයක් ලැබීමට ඇමතිවරයා වැඩ සලස්වා තිබේ. විද්‍යාව උගන්වන ගුරුවරුන්ට විශේෂ ධෛර්යයක් දීම සඳහා ඔවුන්ගේ වැටුප්ද වැඩි කළේය. විද්‍යා උපකරණ සඳහා වර්ෂයකට රුපියල් 7,00000 ක්ද මෙතුමා වෙන් කරන ලදී. ඉදිරි කාලයේ විද්‍යා අධ්‍යාපනයේ දියුණුව සඳහාද මෙතුමා වැඩි සලස්වා ඇත. මෙතුමාගේ මෙම නව විද්‍යා අධ්‍යාපනය හේතුකොට ගෙන ගොවියාගේ, කම්කරුවාගේ, ධනපතියාගේ පුතුන්සිත් එක සමානව දේශකරවරු, ඉංජිනේරුවරු වීමට ඉඩ සලසා දුන්නේය.

යූ. ඇන්. පී. පාලන කාලයේ බිල්ලට දමා තුබූ සවභාෂා ගුරුවරයා පෙරමුණට ගෙන ගම්බඳ පාසල්වල ඉගැන්වූ ඔවුනට පාසල් පරීක්ෂා සහතුරු දීමට ද විධි විධාන යොදවන ලදී. මේ වැඩ පිළිවෙල නිසා සවභාෂා ගුරුවරයාටත් අධ්‍යාපන අධ්‍යක්ෂක බුරය සම්ව ලැබීමට විධි විධාන සැලසී ඇත.

## සවභාෂා උගතුන්

තවද සවභාෂා මාධ්‍යයෙන් උසස් පාඨශාලා සහතික පන්ති ඇරඹීමේ අදහසින් පාසල් කිහිපයක් ජ්‍යෙෂ්ඨ පාඨශාලා තත්වයට එතුමා පිහිටි උසස් කොට ඇත. ඒ සඳහා හැකි සෑම උපාධි ධරයෙකුම බඳවා ගත්තේය. සුළු අවුරුදු කිහිපය තුළ මේ රටේ සමහර උපාධි ධරයින්ට රක්ෂා නොමැතිව තිබුණි. එහෙත් අද රක්ෂා නොමැති උපාධිධරයකු සොයා ගැනීම ඉතා අපහසුය. පොදු සහතික පත්‍ර විභාගය, ඉස්ටර් ඇඩ්වාන්ස් විභාගය, ඉස්ටර් සයන්ස් විභාගය සමත් සියල්ලන්ටම තත්වයට ගැලපෙන පරිදි රක්ෂාවල් සපයන ලදී. සිංහල සහ පාළි ආදී විෂයයන්ගෙන් උසස් ප්‍රවීනත්වයක් ලබා සිටින පණ්ඩිතයින්ට, උපාධි ධරයින්ට ගෙවන වැටුප් ලැබෙන සේ ම පාදුවේ. තවද, සෑම ගුරුවරයෙකුටම උසස් විය හැකි මාර්ග පාදා දී ඇත. ජනවාරි 1 ද සහ ජූනි 1 ද කියා අවුරුද්දට දෙවරක් ගුරුවරයෙකුගේ තත්වය ඉබේට උසස්වන වැඩ පිළිවෙළක් යොදා තිබේ. මීට පෙර ගම්බඳ




විජයානන්ද දහනායක අධ්‍යාපන ඇමතිතුමා විද්‍යොදය මහා පිරිවෙනද සරසවි බවට පත් කරන ලදී.

මෙහි දැක්වෙන්නේ විද්‍යොදය මහා සරසවියයි.



විජයානන්ද දහනායක අධ්‍යාපන ඇමතිතුමා සරසවි බවට පත්කරන ලද විද්‍යාලංකාර මහා පිරිවෙන මෙහි දැක්වේ.



සුණු පොහොර සුවඳ මලින් බුදුන් පිදීමට අමතක නොකරන විජයානන්ද දහනායක මහතා මල් වට්ටියක්ද රැගෙන පන්සල බලා යන සෑම අවස්ථාවක පාසල් ළමුන් පිරිසක් “බනිස් මාමා” කියමින් ඒ මහතා වටකරගත්, මෙසේ තම ආදරය පෙන්වන අවස්ථාද එමවිට.

කිසිදු පාසලක ඉංග්‍රීසි අධ්‍යාපනයක් නොසිඳීමෙත් අධ්‍යාපනවී ගිය ඉංග්‍රීසි අධ්‍යාපනය දියුණු කිරීම සඳහා ඉංග්‍රීසි ගුරුවරුත් පත් කළේය. සෑම මන්ත්‍රී කොට්ඨාශයකත් පාසාම විද්‍යා උපකරණ සහිත අළුත් විද්‍යාගාර පිහිටුවීමෙත. එසේම ශාරීරික අධ්‍යාපනයේ ප්‍රගතිය තකා බොහෝ පාසල්වලට ක්‍රීඩා පිට්ටනි ඇතිකොට ක්‍රීඩා උපකරණ ලබාදුන් මෙතුමා නිරෝගී සම්පන්න සිසු කැලක් ඇති සීමවට විධි විධාන සැලසීය. යූ. ඇන්. පී. පාලන සමයේ ගව මඩුවලටවත් වඩා අස්සව තිබූ ගම්බඳ පාසල්වලට නව ශෝධනැසිලි ලබාදී සර්ව සම්පූර්ණ පාසල් බවට පත් කළේය. බාල දක්ෂ ව්‍යාපාරය පාසල් කාල සටහනේ එක් අංශයක් කළේය.

එදා අභ්‍යාස විද්‍යාලයට ප්‍රවේශ විභාගයෙන් සමත් වූ දුප්පත් සිසුවකු අභ්‍යාස විද්‍යාලයේදී පුහුණුව ලැබුයේ තමාගේම අතින් මුදල් වියදම් කරගෙනය. එය දුප්පත් ජනතාවට ඉතා බැරෑරුම් කාරියක් විය. එහෙත් අද ඒ ක්‍රමය නැතිකොට ඕනැම සිසුවකුට එකී අධ්‍යාපනය ලැබීමට පහසු මාර්ග සලසා ඇත. එනම් ඉස් සමත්වූ අපේක්ෂයින්ට පාසල්වල පත්වීම් දී අවුරුද්දක් ඉගැන්වූ පසු පුහුණුව පිණිස විද්‍යාලවලට ගැනීමයි. එවිට ඔවුන්ට වේතනයක් ද ලැබේ. ඉන් ඔවුන්ගේ වියදම් දරා ගැනීමට පිළිවන. දහනායක මහතාගේ මේ ශ්‍රේෂ්ඨ වැඩ පිළිවෙල නිසා අද දුප්පත් දරුවකුට විශාල සහනයක් ලැබී ඇත. රැකිරක්ෂා ප්‍රශ්නය තරමක් දුරටවත් නිරාකරණය කිරීමට උනන්දුවක් දැක්වූ මෙතුමා වෘත්තිය අධ්‍යාපන ක්‍රමයක් ද සකස් කළේය.

## විදුදය — විද්‍යාලංකාර

බසට—දයට කවිදින් දිරිදුන් මෙතුමා බෞද්ධයින් මුදුන් මල් කඩක් වශයෙන් අගය කරන විදුදය—විද්‍යාලංකාර මහ පිරිවෙන් දෙකට විශ්ව විද්‍යාල සත්වය පිරිනැමීමෙන් අපේ ජාතිය පටන් ගත් ද සිට තුබූ අඩුවක් සපුරා ලීය. කණිෂ්ඨ පිරුවෙන්, ජ්‍යෙෂ්ඨ පිරුවෙන්, විශ්වවිද්‍යාලය පිරුවෙන් වෙනුවෙන් කොටස් තුනකට වර්ග කළ මෙතුමාගේ පිරුවෙන් පනත, බී. ඒ. උපාධියට හා සමානව සිංහල උපාධි ක්‍රමයක් ද සකස් කළේය.

ලංකාවේ මෙයට පෙර කිසිම සිංහලයකුගෙත් ඉටු නො වූ මේ භාරදූර කාර්යය—එනම් මහා පිරුවෙන් දෙක විශ්ව විද්‍යාලයක් බවට පත් කිරීමෙන් විජයානන්ද දහනායක තැමා ලංකා ඉතිහාසයේ පමණක් නොව ලෝක ඉතිහාසයෙයි පවා නොමැකෙන අකුරෙන් ලියවී ඇත. වංශ කථාවේ ඉදිරි කොටස ලියැවෙන දිනක මේ අසිමහසවත් රුකුල් ගැත්වූ පුණ්‍යයාගේ භූමිට සිමවන්නේ ඉහළම සථානයකියි.

## 20,000 කට රැකියා


මහාජන එක්සත් පෙරමුණේ එදා සිටි සමහර ඇමති ශ්‍රේෂ්ඨයෝ ලෝකය වටා රවුම් යද්දී, දිවා රෑ නොබලා—නිවාඩු ද නොබලා—පොහොය ද නොබලා කොළඹ මාලිගේ විදියේ සිය අධ්‍යාපන කාර්යාලයේදී වැඩ සිය යුතුකම් ඉටු කල මේ විභාග දියටම වැඩ කළේය. නොකැවී වැඩ කළේය. ෆෝන් දිනපාම සිය කාර්යාලයටම උදේ 8 ට පැමිණෙන මෙතුමා, සම නිවාඩු ද නොතකා නිදහස් රාත්‍රී දෙගුණ පමණ වන පුරු තම සේවය රටවැසියා වෙනුවෙන් කැප කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රේෂ්ඨ සම්ඳුන් 20,000 කට පමණ රැකි රක්ෂා සැපැයීමට දහනායක මහතාට පිළිවන් විය. මේ අනුව තමා, ජාතිය වෙනුවෙන් භාරගත් කාර්යය මැනවින් ඉටුකල අතර රටේ රැකියා ඇතිකිරීමේ රැකිරක්ෂා ප්‍රශ්නය ද ලිහිල් කර තිබේ.

## වර්ජන ව්‍යාපාර

ගෙවුණු අවුරුදු කිහිපමාරු තුළ මාක්ස්වාදීන්ගේ වැඩ වර්ජන ඔක්සි රජයේ සංවර්ධන ව්‍යාපාරයන් අඩපන වී සිටි දුටු මෙතුමා, මාක්ස්වාදීන්ගේ මේ මහජන දෝෂී ක්‍රියාවන් කරගේ හෙළා දැක්මින් මහජන පිළිතුරුට ලක් කරන ලදී. ඉසුකිය හා වැඩ වර්ජනයකදී කොළඹ වරායේ නැම්මල පිරි, සිනි ආදිය යොද නොදුම් කියා පාසල් ළමයින්ගේ ඔක්සිට ද සඳටුම්පිට මං පාදුවී. මේ බව දුටු දහනායක මහතා කාලසහදියෙන් වැඩි මිලට පිටි ගෙන්වා පාසල් සිසුන්ගේ දවල් ආහාරය නොකඩව සපයන ලදී.

## අගමැතිකම ගත්දාසිට කළ වැඩ විතර රටක් වටී

දිවංගත ගරු බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමා එක්සත් ජාතීන්ගේ සමුළුවට සහභාගී වීම සඳහා යෑමට



ශාරීරික අධ්‍යාපනය නගා සිටවීමටද අධ්‍යාපන ඇමති වි. දහනායක මහතා කාලේ අනුපම සේවයකි. ප්‍රථම වරට ඔස්ට්‍රේලියාවට පිටත්කර යැවීම සඳහා ලංකාවේ සාමාන්‍ය පාඨශාලාවලින් තෝරාගන්නා ලද ක්‍රිකට් ක්‍රීඩා ගුරුයින් පිරිස සහ එහි සංවිධායක ඒ. ජී. ජී. පෙරේරා මහතා සමග ගරු දහනායක මහතා මෙහි සිටී.

නියමිත තිබියදී එතුමා දහනායක මහතා සිය නිවසට කැඳවා තමා, එතතුරු අගමැති පදවියෙහි වැඩ බලත ලෙස ඉල්ලා සිටියේය. එතුමාගේ මේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ දහනායක මහතා තමාට එවැනි භාරදූර කාර්යයක් එම අවස්ථාවෙහි පිළිගැනීමට නො හැකි බව කියා සිටියත්, එම කාර්යය භාර ගැනීමට කැබිනට් මණ්ඩලයේ සිටි එක සුදුස්සා දහනායක මහතා බව බණ්ඩාරනායක මහතා තරයේ කියා සිටියේය. එය භාරගත යුතුයයි එතුමා දහනායක මහතාටත් ඇවිටිලි කළේය. අන්තිමේදී, කවදත් නායකයාගේ සිතට පිටුපා එතුමාගේ සිත් තැලීමට නොසතුටු වූ දහනායක මහතා බණ්ඩාරනායක මහතාගේ ඉල්ලීමට එකඟ වූයේය.


එසේ තිබියදී සාහසිකයෙකුගේ වෙඩි පහරින් හදිසියේ මියගිය ගරු බණ්ඩාරනායක මහතාගෙන් හිස්වුණු අගමැති පදවියට දහනායක මහතා පත් කළ යුතු යයි තම කැබිනට් සගයින් එක හෙලා කියා සිටිද්දී දහනායක මහතා විසින් එම ඉල්ලීමද දෙවර—තෙවරක් ප්‍රතික්ෂේප කළේය. එහෙත් එය භාරගත යුතුමයයි ඔවුන් කියා සිටියෙන් ජාතියේ අවැඩතම් අවස්ථාවක ජාතිය වෙනුවෙන් ඉදිරිපත් නො වී ජාතිය අතරමං කිරීමට නොහොත බව සලකා හරු අග්‍රාණ්ඩුකාරතුමාගේ ද ඉල්ලීම් පරිදි කඳුළු ගංගාවක් මධ්‍යයේ එම භාරදූර වගකීම බාරගත්තේය.

දහනායක මහතා අගමැති වුව පමණි. එක අසකින් තොකඩකප්පල්කාරී මාක්ස්වාදීන් අසාධාරණ ස්ට්‍රයික් මගින් රාජ්‍ය බිඳීමට මාන බැලූහ. අතික් අතින් රදල බලය ආරක්ෂා කල යූ. ඇන්. පී. කාරයින් ඊර්ෂ්‍යා සහගතව නායකයෙකුත් බොරු ප්‍රචාරයන් පතුරුවන ලදී. රදල පවුලකට අයත් නො වූ ප්‍රථම පොදුජන අගමැතිවරණ දහනායක මහතා වූයෙන් ඊර්ෂ්‍යා සහගත හැඟීම් ඇති කරගත් එද ඒ මහතාගේ කැබිනැට්ටුවේ සිටි රදල පෙළැන්තියේ මැති ඇමතිවරු මහ දවල් මේ පොදුජන අගමැතිවරයාගේ බෙල්ල කැපීමට තැත් කළෙත් මෙතුමා ඊර්ෂ්‍යා සහගත මැති ඇමතිවරු තම කැබිනට් මණ්ඩලයෙන් පිට කළේ එක රැයකින්.

දහනායක මහතා අගමැති ධුරය භාරගත් ද සිට රටේ විභාග හා සාමය ආරක්ෂා කිරීමට දැඩි ක්‍රියා මාර්ගයක් ඇති කළේය. රටත් ස්ට්‍රයික්—දවාලටත්—ස්ට්‍රයික්—සවසටත් ස්ට්‍රයික්—මේ තයින් දවස් 365ම ම ස්ට්‍රයික් කරමින් මේ ලංකාව බංකලොත් කිරීමට දැරූ ලූ කඩාකප්පල් කාරින් ගේ ඒ ස්ට්‍රයික් එක රැයින් අත්හිටවූ මේ සුදුම පීරෝබර අගමැතිවරයා, මෝතයම් අත්දමකවත් කඩා කප්පල්කාරී වැඩකට රටේ ඉඩක් තැබුවේ නැත.

මෙතුමාගේ මේ වැඩ සමහර ධනපති ප්‍රභූති පත්තරවලට මහත් රුදවක් විය. පත්‍ර මාර්ගයෙන් අමූලික බොරු ප්‍රචාර කරමින් මෙතුමා පිරිසීමට ගත් උත්සාහය සුළු පටු නොවේ. ඒ කිසිවකට පසුබට නො වූ මේ විජයානන්ද දහනායක අගමැතිවරයා එඩිතර කමින් යුතුව තම සේවය ඉටු කළේය. අගමැති පුටුවේ වැඩිවී මසක් ගැවුණි පමණි, ස්ට්‍රයික් බිල්ලාගේ තොල්මත් තතර වූයේය. තෙමසක් යතවිත්, අල, ලූණු, මිරිස් මිල පහත වැටුණේය. ජීවත වියදම පහත හීයේය. මතක ඇතිකාලයක නැති තරම් සමකාමී බවක් රටේ උද්ගතවූ බව පෙනුනේ. එතුමා වැඩ කළේය. දිවා රාත්‍රී කිසිම විවේකයක් නො ලබා වැඩ කළේය. සතුරන් විසින් පතුරුවන නොයෙකුත් කථා හැත කිසිදු පසුබටවීමක් නො වූ මෙතුමා, මහජනයා වෙනුවෙන් කළ යුතු සේවය දිගටම කරන්ට විය.

කවදත් මහජන මතයට ගරු කරන—මහජන මතයට කන්දෙන මෙතුමා, මැති සභය විසුරුවා හැර අලුත් මන්ත්‍රීන් පත් කිරීමට මහා මැතිවරණයකට කටයුතු සැලස්සුවේය. ලංකාවේ දේශපාලන පොරපිටියේ අවුරුදු 25 කට වැඩි කාලයක් මහා පලපුරුද්දක් හා අත්දැකීමක් ලද මෙතුමා රටට ඔබින—රට කරගෙන ගිය හැකි ප්‍රතිපත්ති මාලාවක් සකස් කරගෙන අලුත් පක්ෂයක් පිහිටුවන ලදී. ලංකා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය වෙනුවෙන් හඳුන්වන මෙතුමාගේ නායකත්වයෙන් පිහිටුවන ලද පක්ෂයේ අපේක්ෂකයින් 105 දෙනෙක් මහා මැතිවරනයේ තරග බිමට බැස සිටිති.



සමුපකාර ව්‍යාපාරයටද රුකුල් දුන් දහනායක මහතා සමුපකාර තොග වෙළඳ ආයතනයේ අලුත් ගබඩාව විවෘතකල අවස්ථාව.

**විජයානන්ද දහනායක මහතාගේ නායකත්වයෙන් ඇති ලංකා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ මැතිවරණ ප්‍රකාශණය මෙසේය:**

1. **විදේශකටයුතු**
   විදේශීය වූ කිසිම දේශපාලන බල මණ්ඩලයකට නොබැඳී සිටින අතර අපේ රට සියළුම රටවල් සමග මිතුරු ලීලාවෙන් තව දුරටත් කටයුතු කරනු ඇත.

2. **ආගම් ඇදහීමේ නිදහස**
   සියලුම ආගම් ඇදහීමේ සම්පූර්ණ නිදහස දීම අප පක්ෂය මගින් අනුගමනය කරනු ඇත.

3. **සාමය හා නීති ගරුක බව**
   සාමය හා නීති ගරුක බව රැකීම සඳහා ආණ්ඩුව දැඩි සැලකිල්ලක් දක්වනු ඇත.

4. **ජාතීන් හා ආගම් අතර සුහදතාවය**
   ජාතීන් අතර හා ආගම් අතර සුහදතාවය අප පක්ෂය විසින් අනුමත කරනු ඇත. විවිධ ජාතීන් හා ආගම් අතර මිතුරු භාවය හා සහයෝගය ඇති කිරීමට අප පක්ෂය මගින් කටයුතු කරනු ඇත.

5. **රාජ්‍ය භාෂාව**
   සිංහල භාෂාව පමණක් රාජ්‍ය භාෂාව ලෙස පිළිගත සිංහල භාෂා ව්‍යවස්ථාන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත. දෙමළ භාෂාවේ සාධාරණ භාවිතයට ඉඩ දෙනු ඇත.

6. **ඉන්දියානු ප්‍රශ්නය**
   යුක්ති සහගත පෙළඹවීමේ ක්‍රමයක් අනුව පුරවැසියන් නොවන ඉන්දියානු ජනයා හැකිතරම් දුරට ආපසු යැවීම සඳහා ඉන්දියානුන් පිළිබඳ ප්‍රශ්නය ගැන ඉන්දිය ආණ්ඩුව සමග වහාම සාකච්ඡා කරනු ඇත.

7. **විදේශිකයන්ගේ පදිංචිය**
   අවසර නැතිව එන විදේශිකයන් එසේ කිරීමෙන් වැළැක්ම පිණිස තදින් කටයුතු කරනු ඇත.

8. **අල්ලස් හා අයුතු ප්‍රයෝජන**
   අල්ලස් ගැනීම හා අයුතු ප්‍රයෝජන ලැබීම වැළැක්වීමට පුළුවන් සෑම පියවරක්ම ගනු ඇත.

9. **ජීවන වියදම**
   ජීවන වියදම අඩු කිරීම සඳහා පුළුවන් සෑම පියවරක්ම ගනු ඇත.

10. **නිවාස ප්‍රශ්නය**

ජාතික නිවාස ක්‍රමයක් ආරම්භ කරනු ඇත. එහි ප්‍රධාන අංශයක් පළාත් පාලන ආයතන මගින් ක්‍රියාත්මක වනු ඇත.

11. **ජාතික සැලැස්ම, ගොවිතැන්හා කර්මාන්ත**

දස අවුරුදු සැලැස්ම කොටස් වශයෙන් ක්‍රියාවේ යොදනු ඇත.

12. **අධ්‍යාපනය**

අධ්‍යාපන ක්‍රමය සමාජ හා ආර්ථික ඕනෑ එපාකම සිරිමැසෙනේ සකස් වනු ඇත. ආධාර ලබන පාඨශාලා රජයට ගැනීමේ බල කිරීමක් කරනු නො ලැබේ. බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු, මුස්ලිම් හා එවැනි ආගමික අධ්‍යාපන ආයතනවල දැනට තිබෙන බලතල වල වෙනසක් සිදුකරනු නොලැබේ. පිරිවෙන් විශ්ව විද්‍යාල දෙකෙහි අභිවෘද්ධිය සඳහා විශේෂ සැලකිල්ලක් දක්වනු ඇත. දෙමළ භාෂා මාධ්‍යයෙන් විශ්වවිද්‍යාලයක් පිහිටුවීමට ඉඩ දෙනුඇත.

13. **සෞඛ්‍ය පහසුකම්**

දුෂ්කර රෝහල්වල හා ආදල ආයතනවල අඩු පාඩු සිරි මැසීම ගැන වහා කටයුතු කරනු ඇත. ආයුර්වේද ක්‍රමය හැකි තරම් දුරට දියුණු කිරීමට කම යුතු සලස්වනු ඇත.

14. **සමාජ සේවා**

ආධාර ලැබියයුතු සෑම කෙනෙකුටම අවශ්‍ය ආධාර ලැබෙන පරිදි සමාජ සේවා සඳහා වැඩිපුර මුදල් මැය කරනු ඇත.

15. **කම්කරු සේවය**

කම්කරු සේවකයන් වෙනුවෙන් දිනකට පැය අටක වැඩද, යුක්ති සහගත මූලික වැටුපක්ද, නිවාඩු පහසුකම් හා අර්ථ සාධක වැටුප් ක්‍රමයක්ද ඇති කරනු ලැබේ.

16. **රජයේ සේවකයෝ**

කාර්යක්ෂම හා තෘප්තිමත් සේවයක් ඇතිකිරීම සඳහා පුළුවන් සියළුම කටයුතු කරනු ඇත. යුක්ති සහගත වෘත්තිය අයිතිවාසිකම් වලට ඉඩදෙනු ලැබේ.

17. **අවශ්‍ය සේවා**

අත්‍යාවශ්‍ය සේවාවන්හි නිරත වුවත් වැඩ තැවැත්වීම (ස්ට්‍රයික්) ඇදීයෙහි යෙදීම වළක්වනු ඇත.

18. **වෙළඳ කටයුතු**

වෙළඳම ලාංකිකයන් සතු කිරීමට කටයුතු කරන අතර සමුපකාර වෙළඳ ව්‍යාපාරවලට සහ පුද්ගලික ව්‍යාපාරවලටද ඉඩ දෙනු ඇත.

19. **පළාත් පාලනය**

චෞද්ද වාර්තාවේ ප්‍රගතිශීලී යෝජනා ක්‍රියාවේ යොදනු ලැබේ. පළාත් පාලන ආයතන වෙනුවෙන් දැඩට වඩා මුදල් වෙන් කරනු ඇත.

20. **රක්ෂා සැපයීම**

විවිධ සංවර්ධන ක්‍රම යටතේ හා අලුත් එක්සිරිම අනුව හැකිතරම් රක්ෂාවල් සපයනු ඇත.

21. **ජනයකු කිරීම**

විදේශීය වෙළඳම තැතිවන නිසා, ජන සතුකිරීම නිසා ව්‍යාපාර දුර්වල වන නිසාත් වෙතුවිට ජනයකු කිරීමට අදහස් කරනු නොලැබේ. බැංකු හා ඉන්ෂුවරන්ස් ක්‍රම සම්බන්ධව කටයුතු කිරීමට පෙරළුවි, සලකා බැලීම පිණිස සම්මුළුවක් පත් කරනු ඇත.

22. **ශාසන නොම්සම හා සංඝ සංයෝජනය**

සඟ සම්බන්ධව ගන්නා සෑම පියවරත්ම සිස්සුත් වහන්සේලා වෙනුවෙන් පත්වී ඇති සියළුත් සිය ස මණ්ඩලවල අනුමැතිය ඇතිව සිදුකෙරේ. එවැති එකම මණ්ඩලයක වත් අදහස් වලට විරුද්ධව සිසිවස් නොකරනු ඇත.

## රදලයන් නොවේ

දහනායක මහතා, කිසිම දුක පරදයෙයි තැන පරාජය එක යටතකට අහගැසුවේ ද තැන. සිය සිය තැති හැකනිසිත්ම මේ පුදුම තායකයා ගත්තේ විශේෂ ජයකි. ලංකාවේ අගමැතිකම සඳහා ඒ මහතාට එක අඩුවක් තිබේ. එනම් රදල පවුලකට අයිති නොවීමයි. එහෙත් මේ රටේ පුත්‍රියත්—සාධාරණයට ගරුකරන මහජනයා රදල පවුලක සොතෙක් ලංකාවේ අගමැති පුටුවට තෝරාගැනීමට තරම් අද මෝඩ නැත. දහනායක මහතා නිරහංකාරය, කාරුණිකය, අවංකය. දුප්පතා සමග හැසිරෙ—දුප්පතාගේ දුක මැකවීත් දක්ෂ මෙතුමාගේ හදවත දුප්පතා වෙනුවෙන් නිතරම උණු වශයෙය.

භාරත පියාණන්වූ මහත්මා ගාන්ධිතුමා දහනායක මහතා වෙනුවෙන් එදා පළකළ අනාවැකිය අද සත්‍ය බවට ඔප්පුවී තිබේ. අද මෙත් මෙහෙවත් විජයානන්ද දහනායක සාමය ම ශ්‍රී ලංකාවේ බැබලෙවා ඇත.

විජයානන්ද දහනායක මහතා අධ්‍යාපන ඇමති ව සිට ලංකාවේ අධ්‍යාපන තත්වය උසස් කිරීම සදහා කල ඉමහත් සේවය මේ සංඛ්‍යා ලේඛන වලින් ඔප්පුවන්නේය.

| | 1955 / 56 | 1959 / 60 | වැඩිවී ඇති සංඛ්‍යාව |
|---|---|---|---|
| (1) රජයේ ගුරුවරුන් සංඛ්‍යාව<br>ඉංග්‍රීසි — 6348 සිංහල — 18136 දෙමළ — 2736 | 27,320 | 9493 / 28194 / 4363<br>42050 | 15,750 |
| (2) විද්‍යා ගුරුවරු | — | 800 | 800 |
| (3) උසස් පාඨශාලා සහතික පත්‍ර පන්තිවලට ඉගැන්වීම සඳහා පුහුණු කරන ලද විද්‍යා ගුරුවරු | — | 31 | 31 |
| (4) රසායනාගාර | 40 | 180 | 140 |
| (5) විද්‍යා ශිෂ්‍යත්ව | — | 2377 | 2377 |
| (6) පුහුණු ගුරුවරු | 2905 | 4397 | 1492 |
| (7) පාසල් — රජයේ ආධාර ලබන එකතුව<br>ඉංග්‍රීසි 327·346·673 සිංහල 2795·1229·4024 දෙමළ 553·638·1191 | 5888 | 786 / 4928 / 2228<br>7942 | 2054 |
| (8) පාසැල්වල කාර්මික අංශ | 25 | 515 | 490 |
| (9) රජයේ පාසැල්වල එච්. එස්. සී. පන්ති | 43 | 242 | 199 |
| (10) තත්වය උසස් කරන ලද පාසැල් | — | 111 | 111 |
| (11) පාසැල්වල පැමිණීම | 1,665,796 | 2,153,050 | 487,254 |
| (12) වැය වූ මුදල් | රු. 148,581,722 | රු. 243,197,810 | 104,616,008 |
| (13) සවභාෂා පාසල්වල මූල්ගුරු පදිවලට උසස් කිරීම | — | 805 | 805 |

| 1955 / 56 | | |
|---|---|---|
| සවභාෂා මූල් ගුරුවරුන් උප පරීක්ෂක තනතුරුවලට උසස් කිරීම | 38 | 38 |
| සංඛීය ගුරුවරු 150 | 758 | 608 |
| ශාරීරික අභ්‍යාස පුහුණු වීමේ සථාන 50 | 95 | 45 |

1955 දී තිබුණු අභ්‍යාස විද්‍යාල 19 (රජයේ 12, උපකෘත 7) 1956 වන විට 25 ක් විය. තවත් අභ්‍යාස විද්‍යාල 6 ක් ගරු අගමැති තුමාගේ කාලයේ, 1956 සිට 1960 දක්වා, වැඩි විය. මෙයිත් සසරක් උපකෘත අභ්‍යාස විද්‍යාල වූ අතර දෙකක් මුස්ලිම් අභ්‍යාස විද්‍යාල විය.

පහත දක්වෙත සංඛ්‍යා ලේඛත වලිත් ඇහැදිලිවත අත්දමට පුහුණු වූ ගුරුවරුන්ගේ ගණක වැඩිවී ඇති බව පෙතෙනු ඇත.

| | රජයේ | උපකෘත | එකතුව |
|---|---|---|---|
| **1955** | | | |
| සිංහල | 1075 | 555 | 2255 |
| දෙමළ | 373 | 273 | 646 |
| **1956** | | | |
| සිංහල | 1,684 | 551 | 2235 |
| දෙමළ | 324 | 273 | 597 |
| **1957** | | | |
| සිංහල | 2,262 | 577 | 2839 |
| දෙමළ | 441 | 273 | 714 |
| **1958** | | | |
| සිංහල | 2,380 | 701 | 3081 |
| දෙමළ | 572 | 253 | 825 |

| | රජයේ | උපකෘත | එකතුව |
|---|---|---|---|
| **1959** | | | |
| සිංහල | 2526 | 9031 | 3429 |
| දෙමළ | 749 | 267 | 1016 |
| **1960** | | | |
| සිංහල | 2803 | 1051 | 3854 |
| දෙමළ | 1129 | 345 | 1464 |

පහත දක්වෙන සංඛ්‍යා ලේඛන වලින් 1956, සිට 1960 දක්වා කාලය තුළදී වැඩිවී ඇති පුහුණු ගුරුවරුන්ගේ ගණන පැහැදිලිවනු ඇත. පුහුණු මුස්ලිම් ගුරුවරුන්ගේ සංඛ්‍යාව බොහෝසේ වැඩිවී ඇත.

1950 ට පෙර ගුරුවරුන්ට පුහුණු වීමට ඇති අවස්ථා ඉතාම දුෂ්කර වී තිබිණ. රජයේ පාසැල්වල තම අවුරුද්දත්වත් නොකඩවා සේවය කර තිබිය යුතුවූ අතර උපකෘත පාඨශාලාවල තම අවුරුදු පහක අඛණ්ඩ සේවයක් පුහුණු වීමේ කාලය තුළදී පත් ලැබීම සඳහා අවශ්‍යව තිබිණ. 19566ත් පසුව උපකෘත පාසැල්වල ගුරුවරුන් එක් අවුරුද්දක සේවයෙන් පසුව අභ්‍යාස විද්‍යාලයේදී පත් ලැබීමට නීති රීති වෙහස් කරන ලදුව, එය ඉත්පසුව තුන් මයක සේවය දක්වා අඩුකරන ලදී.